# කල්‍යාණ මිත්‍ර

'මචං මේක පරෙස්සම් කරලා තියාගනින්, මං ඕන වුණාම ආයිත් ගන්නම්." හතරට පහට නැමූ කොළයක් සමන්ගේ අතේ ගුලිකල අමල් කඩිනමින් ආයතනයේ විවේකාගාරය වෙත පිය නැගීය. තවමත් කිසිවක් සිතාගත නොහැකිව සිටි සමන් අතේ ඇති කොළය සෙමෙන් දිග හැරීය.

ආදරයෙන්, ඊයේ අපේ ගේ ළඟින් ඔයා ගියා, මම දැක්කා. කොහොමද දන්නේ මම එහේ ඉන්න බව. ආයිත් එන්න එපා. පුරුදු තැනේදී හමුවෙන්නම්, හෙට වැඩ ඇරිලා යන වෙලාවට. මම දීපු ඇඳුම හොඳද?

මේ නෙළුම්

තවමත් සිත තුළ පෙරළි කරන පුදුමයෙන් සමන් යලිත් ඒ කඩදාසිය කියවා බැලීය. මේ මිනිහා ලොකු විනාශයක් කරලයි පස්ස බලන්නේ, ඔහු අමල් ගැන කේන්තියෙන් සිතීය. අමල් තම ආයතනයට එක්වුනේ තමා සමග එකම දිනයේය. අමල් තමාගේ කල්‍යාණ මිත්‍රයෙක්සේ දුකට සැපට පිහිට වෙමින් එකාවන්ව එක බත්පත කා එකම බෝඩිමක වසර ගණනාවක් සෙවනැල්ල සේ සිටියේය. එත් මීට වසර දෙකකට පෙර සමන් මනීශා සමග විවාහවූ පසු ඔහු තමාගේම නිවසට පදිංචියට ගියේය. එත් ඔවුන්ගේ මිත්‍රත්වය අබමල් රේණුවක තරමකින්වත් පළුදු නොවී යහතින් පැවතිණි. නමුත් කාලයක සිට අමල්ගේ සැක කටයුතු ගමන් බිමන් ඇවතුම් පැවතුම් වැඩිවී ඇත. සමන් දන්නා තරමින් ආයතනයට අළුතින් එක්වුණ නෙළුම් නිසා අමල්ගේ විශාල වෙනසක් සිදුවෙමින් පවතින බව පැහැදිලිය.නෙලූම් විවාහකය. රූමත්ය. එක්දරු මවක් වන ඇය දුටුවන් වශී කරවන නෙලූම් මලක් වැනි නෙතු යුගලක හිමිකාරිකි තම පවුල ගොඩනගන්නට අපමණ වෙහෙසෙන දයාබර ස්වාමියකුගේ හිමිකාරියකි. එනමුත් අමුතුම හැසිරීමක් ඇයට හිමිය. ඇගේ වශී දැළට හසුවූ අමල් සමන්ටද හොරා ඇය සමග සම්බන්ධයක් ගොඩනගාගෙන ඇති බවට ඔහු අත තැබූ ලිපිය හොඳ සාක්ෂියකි.

තව සති කීපයකින් විවාහවන්නට සිටින අමල් මේ කරන දේ නොහොබිනා බව කිව යුතුය. ඔහු තවත් ජීවිත කිහිපයක් අනතුරේ දමා තමාද අනතුරේ වැටෙන්නට යයි. මේ සියලූ කටයුතු වලින් නෙළුම්ගේ අත දරුවාගේ අනාගතය අඳුරුවනු ඇත. සමන් මේ ගැන අමල් සමග කතා කළ වාරයක් පාසා ඔහු එය විහිලූවකට ගත්තා පමණි.මචං, ඔය කරන දේ නිසා නෙළුම්ට එයාගේ පවුල නැති වේවි. ඔයාට ආත්මගරුත්වය නැති වේවි. හෙට අනිද්දා කසාද බඳින්නනේ ඉන්නේ. අමල් සුපුරුදු විහිලූවෙන්ම එම ප්‍රශ්ණ මග හැරියේය

"ඉතින් නෙළුම්ගේ පවුල නැතිවුණාම මං එයාව මං එයාව බාර අරගන්නවානේ"හහ් හහ් හහ් "මචං ඒක සීරියස් සම්බන්ධයක් නෙවේ. අපි දෙන්නම විනෝදෙට කරන එකක්. හැබැයි මං කසාද බැන්දාම අනුරාධපුරේට මාරුවෙනවා. ඕනෙනම් සමන් උඹට පුළුවන් නෙළුම් විලේ මල් කඩන්න" දඩන් හඬින් තම පිටටද ගසා අමල් කියූ කථාව සමන්ගේ හිත තුළ කුමක්දෝ නොපහන් හැඟීමක් ඇති කළේය.අමල් සහ නෙලූම් පනිවිඩ හුවමාරු කරගත්තේ ලියුම් කැබලි වලිණි. ඒවායේ නම් කිසිවක් හරියකට නැත. අමල්ට ලැබෙන ලියුම් සියල්ල පරෙස්සමට දුන්නේ සමන්වෙතය. සමන් ඒවා තමා ලග තබාගත්තේ යලිත් අමල්ට දීමටය. ඔවුන් දෙපළ ජංගම දුරකථනය, මුහුණු පොත තම පෙම් පලහිලව්ව අසලකටවත් ගෙන නොඒමට වග බලා ගත්හ. නෙළුම් ඇගේ ස්වාමියාට පතිවත සුරකින අගනා බිරිඳක් බැවින් ඇගේ පතිවත අඩුලුහුඩු තැන් ස්වාමියාට සොයන්නටවත් ඉඩ නොතැබුවාය. අමල්ද තම අනාගත යහපත උදෙසා සියලූ දේ සුදුහුණු ආලේපකර පිළිසකර කර ගත්තේය.

මේ අතර සමන්ගේ ආයතනයේ සහකාර කළමනාකාර තනතුර පුරප්පාඩු විය. ඒ වසර පහක් එම තනතුරේ සිටි සිරිනනද මහතා ඉහළ තනතුරකට උසස් වීමක් ලැබීමෙනි. මේ සඳහා සුදුසුකම් ලබා තිබුණේ වසර අටක පලපුරුද්ද සහ සුදුසුකම් තිබූ සමන් සහ අමල් දෙපළගෙන් කෙනෙකි. ඉහළ යාමේ නොතින් ආසාවෙන් හෙබි අමල් පාලන අංශය වෙත නොයෙකුත් නොමනා කටයුතු කරමින් තමා වෙත එම තනතුර ලබාගන්නට අපමණ වෙහෙසක් සමන්ටත් හොරෙන් ගත්තේය. එහෙත් තවත් මාසයක ඇවෑමෙන් සුදුස්සාට සුදුසුකම ලැබිණි. සමන් කළම්ටියාව සහකාර කළමණාකාර තනතුරට උසස් කෙරුණි. එදා පටන් සමන්ටත් නොදැනෙන්න අමල්ගේ හිත ටිකින් ටික වෙනස් වුණි. එහෙත් ඒ කිසිවක් නොදැන සමන් එදා ලෙසම අමල් ආශ්‍රය කළේය. සමහර දිනවලට අමල්ගේ ලිපිකැබලි සමන්ගේ සාක්කුවට බැගයට දමා අමල් සහකාර කළමනාකරුගේ නිල කාමරයෙන් පිටව යයි. පෙර කී ලිපිය සමන්ට දුන් දින හවස අමල්ගෙන් හදිසි ඇමතුමක් ලැබිණි. "මචං මට උදව්වක් කරන්න. මගේ බයික් එක මග නැවතුණා. මාව බෝඩිමට ඇරලවන්න මං ඉන්නෙ නිශා ඉන් එක ඉස්සරහ". වහාම තම රථයද රැගෙන එහි ගිය සමින් අමල්ව තම වාහනයට නන්වා ගත්තේය. "පොඩ්ඩක් හිටපන් නෙළුම් ඇතුලේ, ගිහින් එයාව එක්කගෙන වරෙන් "අමල්ගෙන් ඉල්ලීමක්. අමල් මම අන්තිම සැරේට කියන්නේ ඔය වැඩේ දැන්වත් නවත්තපන්. සමන්ට ඇත්තටම තම මිතුරා ගැන අමනාපයක් ඇතිවුණි. සමන් ඇතුලට ගොස් නෙළුම් කැදවාගෙන එනවිට අමල් වාහනයේ නොවීය. වාහනයෙන් බැස ජංගම දුරකතනය අතැතිව සිනාමුසුව සිටියේය. නෙළුම් යමු අපි. සමන්ගේ වාහනයෙන් ඔයාව ගෙදර ඇරලවන්නම්. ඒ අමල්ගේ හඩයි. මචං මට ගෙවල් ගානේ යන්න බැහැ, ඕනනම් බස් හෝල්ට් එකේ ඔයාලාව දාලා යන්නම්. සමන් අමනාපය නොපෙන්වා තම මිතුරාගේ ඉල්ලීමට පිටුපෑවේය.

අමල් සහ නෙළුම්ද බස් නැවතුමේ බස්සවා සමන් ගෙදර ගියේය. ගෙදර ගියත් මනීශා වෙනදාමෙන් සුහද නැති බැව් පසක් කරගත් සමන් ඇයි? ඔයාට අසනීපයක්ද? විමසුවේ ආදරයෙන් හිස අතගාමිනි.

අසනීප, අසනීපෙ මටද? ඔයාටද? රටේ ගැනුන්ගේ අසනීප බලාගන්න එකයි ඇත්තේ. මං මේවා ඉවසන්නේ කොහොමද? යකින්නක් මෙන් ඇය ඔහු වෙත කඩාපැන්නේ ඇගේ ජංගම දුරකථනයද තම සාක්කුවේ තිබූ අමල්ගේ ලියුම් කෑල්ලද අතැතිවය. හැමදාම මම ලියුම් කෑලි දැක්කම විසි කළා. අපේ පවුල් ජීවිතේ ගැන හිතලා.අද මගේ fපෝන් එකට ආපු මේ පොටෝ එකෙන් මට ඔයාව එපා වුණා. මොකක්ද මම ඔයාට කරපු වැරැද්ද? මට මෙහෙම කරන්න. මොනවද මේ කියන්නේ? තාමත් අග මුල නොතේරුණ ප්‍රහෙළිකාව විසඳීමට සමන් තතනයි. වැරැද්ද තමුසේ වෙන ගැණු එක්ක නටන එක. මේ කවුද මේ? නෙළුම්. සමන්ට ඉබේටම කියැවිණ.

මම තව එක විනාඩියක් මේ වහළ යට ඉන්නේ නැහැ. මගේ තාත්තට කතා කරල ගෙදර යනවා. මනීශා වැළහින්නක සේ හඩාවැටෙනු බලා සිටින්නට නොහැක. සමන්ට කථාකරන්නට ඉඩක් නැත.එළිවෙන්නට මොහොතකට පෙර පියවුණු ඇස්වල නිදිමත බේරෙමින් උදේම එලාම් ඔරලෝසුවේ කලබැගෑනියට නැගිටගත් සමන්ට ඊයේ සිද්ධිය හීනයකි.කලබලවූ මනීශා පියා සමග කාරයට නැගී තමාට සාප කරමින් ඇගේ මහ ගෙදරට ගියාය. තවදුරටත් සිතමින් කාලය ගත නොකර කාර්යාලයට ගොස් නිවාඩුවක් දමා ඇයට කරුණු පැහැදිලි කර කැදවාගෙන ඒමට යායුතුය.උදෑසනම කාර්යාලයට ගිය ඔහු ආයතන ප්‍රධානියා පැමිනෙනතුරු නිම කලයුතු කටයුතු කරමින් සිටියේය.හැඩි දැඩි පුරුෂයෙක් සැනෙන් තමා වෙත කඩාපැන බොටුවෙන් අල්ලා ගන්නා ආකාරයක් ඔහුට දැනුණි. තමුසේ..... මහ ලොකු තනතුරුවලට මුවා වෙලා අනුන්ගේ පවුල් ඉහිරවන තමුසේ... මහා කලබැගැනියකි. ඔය මහත්මයා නිවීසැනසිල්ලේ කතා කරමුද? වැදගත් විදියට.ආයතන ප්‍රධානියාද එතනය. සර්, මම නෙළුම්ගේ මහත්තයා. මේ මිනිහා ඒ ගෑනි රවට්ටාගෙන අපේ ගිණුම් වල සල්ලි, නෙළුම්ගේ රත්‍රන් බඩු අරගෙන. මේ තියෙන්නේ, මගේ වයිෆ්ට ලියපු ලියුම්.මම... මම එහෙම කලේ නැහැ. සමන්ට උන් හිටි තැන් අමතකය.

නොකල වරදකට නින්දා විදින තරමක්.

කෝ ඔය කියපු ලියුම්. ආයතන ප්‍රධානියා තැන්පත්ව අසයි. නෙළුම්ගේ ස්වාමියා ඒවා සාක්කුවෙන් ඇද මේසය මතට හෙළීය.මේ අත් අකුරු සමන්ගේ නේද? ආයතන ප්‍රධානියා බැරෑරුම් බැල්මකින් සමන්ට සංග්‍රහ කළේය.සර්.. සර්.... ඒවා සර් මගේ තමයි.දෙවියනේ අමල් කාලයක් තිස්සේ තමාට කියා ලියවාගත් ලියුම් සියල්ල මේසය මත සිට තමාට ඔලොක්කු කරයි.සමන් අපිට විශේෂ විනය පරීක්ෂණයක් තියනකල් ඔයාගේ වැඩ තහනම් කරන්න වෙනවා, ආයතනයේම සේවිකාවක් සමග අයථා සම්බන්ධයක් තියාගත්ත වරදට.



අචිනි කොඩිප්පිලි

## මෙවර ආලෝකා සගාරාවට අනුග්‍රහය සැපයූ ඔබ සැමට ස්තූතියි

Tranzfreeze (PTY) Ltd.

වෛද්‍ය ජයන්තා වීරසිංහ මහත්මිය

මංගලා කලන්සූරිය මහත්මිය

නිමල් ජයමහ මහතා

විශේෂඥ මනෝ වෛද්‍ය දුෂ්‍යන්ති තිලකවර්ධන මහත්මිය

සුලාරි බෝගහපිටිය මහත්මිය

රේණුකා ලලනි විජේසුන්දර මහත්මිය

**ඔබත් දායකවීමට කැමතිනම් අමතන්න.**

වෛද්‍ය විනීතා විජේසූරිය - 0430666727